හර්ෂ අමරකෝන්
Harsha Amarakoon

21 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය
General Certificate of Education (Advance Level) Examination

ආර්ථික විද්‍යාව I
Economics I

විනාඩි විස්සයි
Twenty Minutes

- ප්‍රශ්න වලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) ආර්ථිකය, ප්‍රතිගමනාත්මක තත්ත්වයකින් මුදවා ගැනීම සඳහා යෝග්‍ය රාජ්‍ය මූල්‍ය හා මූල්‍ය ප්‍රතිපත්ති වල සංයෝගය පහත සඳහන් ඒවායින් කවරක්ද?

1. බදු අඩු කිරීම සහ රාජ්‍ය වියදම් වැඩි කිරීම
2. බදු සහ මුදල් සැපයුම යන දෙකම ඉහළ දැමීම
3. ආණ්ඩුවේ මිලදී ගැනීම ඉහළ නැංවීම හා මහ බැංකුවේ පොලී අනුපාතිකය පහළ හෙලීම
4. ආණ්ඩුවේ මිලදී ගැනීම පහළ හෙලීම හා මහ බැංකුවේ පොලී අනුපාතිකය ඉහළ දැමීම
5. හිඟ අයවැය ප්‍රතිපත්තියක් යොදා ගැනීම සහ රජය විවෘත වෙළෙඳ පොළේ සුරැකුම්පත් අලෙවි කිරීම

(02) ආණ්ඩුවේ ආර්ථික කටයුතු නොමැති ආවෘත ආර්ථිකයක, ආයෝජන ගුණකයෙහි අගය 5 කි. එම ආර්ථිකයෙහි ආයෝජන මට්ටම රුපියල් මිලියන 2000 කින් වැඩි වුවහොත්, පරිභෝජනය කොපමණ ප්‍රමාණයකින් වැඩිවනු ඇත්ද?

1. රු. මි. 2000
2. රු. මි. 4000
3. රු. මි. 6000
4. රු. මි. 8000
5. රු. මි. 10000

(03) රජය විසින් කුටුම්බ ආදායම මත පනවන බදු ඉහළ නැංවීම නිසා,

A. වැයකළ හැකි ආදායම අඩු වේ
B. ජාතික ආදායම වැඩි වේ
C. සාමාන්‍ය පරිභෝජන නැම්යාව වැඩි වේ
D. සාමාන්‍ය ඉතුරුම් නැම්යාව වැඩි වේ

1. A, B සහ D 2. B සහ C 3. A සහ C 4. A සහ D 5. B සහ D

(04) රාජ්‍ය සහ විදේශ වෙළෙඳාම් අංශ වලින් තොර සරල ආර්ථික ආකෘතියක ඉතුරුම් ශ්‍රිතය $S = -500 + 0.2Y$ වේ. සමතුලිත ජාතික ආදායම රු. මි. 5000 ක් වේ නම් ආර්ථිකයේ සාමාන්‍ය පරිභෝජන නැම්යාව වන්නේ,

1. 0.2 කි 2. 0.8 කි 3. 0.1 කි 4. 0.9 කි 5. -0.1 කි

(05) කල්පිත සරල ආර්ථිකයක ආන්තික ඉතුරුම් නැම්යාව 0.2 කි. ස්වාධීන පරිභෝජන වියදම රු. මි. 600 ක් ලෙස ස්ථාවරව පවතී. මෙම ආර්ථිකයේ ආයෝජන ඉල්ලුම රුපියල් මිලියන 1000 ක් ලෙස ස්ථාවරව පවතී නම් වැයකළ හැකි ආදායම රුලියල් මිලියන 1500 කින් ඉහළ ගියහොත් පෞද්ගලික පරිභෝජන ඉල්ලුම ඉහළ යාම,

1. රු. මි. 1000 2. රු. මි. 1600 3. රු. මි. 1800 4. රු. මි. 900 5. රු. මි. 1200



හර්ෂ අමරකෝන්

(06) සමතුලිතතාවයේ පවතින ආර්ථිකයක අපශේෂණය රු. මි. -500 කි. ස්වාධීන වියදම් ගුණකය 4 කි. පහත සඳහන් ද අතුරින් කවරක් සත්‍ය වේද?

1. C = 500 + 0.25y
2. S = 500 + 0.25y
3. C = -500 + 0.75y
4. S = -500 + 0.75y
5. C = 500 + 0.75y

(07) රාජ්‍ය හා විදේශ වෙළෙඳාම් අංශ වලින් තොර සරල ආර්ථික ආකෘතියක ඉතුරුම් ශ්‍රිතය S = -80 + 0.1y වේ. ආයෝජනය 600 කින් වැඩි වුවහොත් පරිභෝජනය කොතරම් ප්‍රමාණයකින් වැඩි වේද?

1. 540
2. 600
3. 5400
4. 6000
5. 6300

(08) සරල ආර්ථික ආකෘතියක පරිභෝජන ශ්‍රිතය C = 650 + 0.75y වේ. ආයෝජනය 600 කින් වැඩි වුවහොත් ඉතුරුම් කොතරම් ප්‍රමාණයකින් වැඩි වේද?

1. 500
2. 2000
3. 1500
4. 2500
5. 125

(09) පහත තොරතුරු ඔබට සපයා ඇත. (සියලුම සංඛ්‍යා රුපියල් මිලියන වලිනි)

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආයෝජනය | = | 800 | බදු | = | 400 | ආනයන | = | 500 |
| ඉතුරුම් | = | 1100 | අපනයන | = | 600 | මුළු රාජ්‍ය වියදම | = | 500 |

මෙම තොරතුරු අනුව නිවැරදි ප්‍රකාශය කුමක්ද?

| | **නිමැවුම** | **අයවැය තත්ත්වය** | **භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය** |
|---|---|---|---|
| 1. | වැඩි වේ | අතිරික්තයකි | අතිරික්තයකි |
| 2. | වැඩි වේ | හිඟයකි | හිඟයකි |
| 3. | අඩු වේ | අතිරික්තයකි | හිඟයකි |
| 4. | අඩු වේ | හිඟයකි | අතිරික්තයකි |
| 5. | වෙනසක් සිදු නොවේ | හිඟයකි | හිඟයකි |

(10) ආර්ථිකයේ චක්‍රීය ආදායම් ප්‍රවාහයට කරනු ලබන විදීමක් නියෝජනය කරනුයේ පහත දැක්වෙන කවරක්ද?

1. වෙළෙඳ ශේෂයේ හිඟයක්
2. ආණ්ඩුවේ අයවැය ලේඛනයේ හිඟයක්
3. ශුද්ධ බදු ඉහළ යාමක්
4. කුටුම්බ ඉතුරුම්
5. පෞද්ගලික සමාගම් වල රඳවා ගනු ලැබූ ලාභ

(11) කිසියම් ආර්ථිකයක රුපියල් මිලියන 150 කින් ආයෝජන වියදම් වැඩි වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ජාතික ආදායම රුපියල් මිලියන 600 කින් ඉහළ ගියේ නම්, ආන්තික ඉතුරුම් නැඹියාවේ අගය,

1. 0.80 කි
2. 0.75 කි
3. 0.50 කි
4. 0.40 කි
5. 0.25 කි

(12) රාජ්‍ය කටයුතු වලින් තොර සංවෘත ආර්ථිකයක වැයකළ හැකි ආදායම පහළ යාමක් නිසා සිදුවන ප්‍රතිවිපාක වඩාත් නිවැරදිව විස්තර කෙරෙන සංයෝගය හඳුනාගන්න.

| | ආන්තික ඉතුරුම් නැමියාව | සාමාන්‍ය ඉතුරුම් නැමියාව | ගුණකය |
|---|---|---|---|
| 1. | නොවෙනස්ව පවතී | පහළ යයි | නොවෙනස්ව පවතී |
| 2. | නොවෙනස්ව පවතී | ඉහළ යයි | නොවෙනස්ව පවතී |
| 3. | නොවෙනස්ව පවතී | නොවෙනස්ව පවතී | ඉහළ යයි |
| 4. | ඉහළ යයි | ඉහළ යයි | පහළ යයි |
| 5. | පහළ යයි | ඉහළ යයි | ඉහළ යයි |

(13) සරල ආර්ථිකයක ඉතුරුම් $S = -40 + 0.4y$ වේ. මෙම ආර්ථිකය රුපියල් බිලියන 500 දී සමතුලිත ව පවතින විට ආයෝජන වියදම කොපමණද?

1. රු. බි. 340  2. රු. බි. 140  3. රු. බි. 160  4. රු. බි. 300  5. රු. බි. 200

(14) එක්තරා ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය $C = 600 + 0.8y$ වශයෙන් දී ඇතැයි සලකන්න. මෙහි C පරිභෝජන වියදමත් Y ජාතික ආදායමත් නිරූපණය කරයි. මෙම තොරතුරු ඇසුරින් එළැඹිය හැකි නිවැරදි නිගමන වනුයේ කවරක්ද?

1. සෑම ආදායම් මට්ටමකදී ම ඉතුරුම් ධන අගයක් ගනී.
2. ආදායම වැඩි වත්ම ආන්තික ඉතුරුම් නැමියාව පහළ බසී.
3. ආදායම වැඩි වත්ම ආන්තික පරිභෝජන නැමියාව පහළ බසී.
4. සාමාන්‍ය පරිභෝජන නැමියාව නොවෙනස්ව පවතී.
5. ආදායම වැඩි වත්ම සාමාන්‍ය පරිභෝජන නැමියාව පහළ බසී.

(15) සරල ආර්ථිකයක සමස්ත නිමැවුමේ සමතුලිත අගය රුපියල් බිලියන 800 ක් ද, සමාහාර ඉල්ලුම රුපියල් බිලියන 900 ක් ද වේ නම් මෙම ආර්ථිකයට අදාල නිවැරදි සංයෝගය තෝරන්න.

| | ඉතුරුම් වලට වඩා ආයෝජන | තොග වෙනස | නිමැවුම |
|---|---|---|---|
| 1. | අඩු ය | ධන | අඩු වේ |
| 2. | වැඩි ය | සෘණ | අඩු වේ |
| 3. | වැඩි ය | සෘණ | වැඩි වේ |
| 4. | අඩු ය | ධන | වැඩි වේ |
| 5. | වැඩි ය | සෘණ | වෙනසක් නොවේ |

හර්ෂ අමරකෝන්